# මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
# අමාත්‍ය මණ්ඩල සංදේශය

සංදේශ අංකය : 2019/CP/08
යොමු අංක : **MMWD/U/UD/SW/CP-15**

---

## කසලවලින් විදුලිය නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කරනු ලබන කසල පිරිසැකසුම් හා පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය. සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම

**පූර්ව යොමු අංක :**

අමාත්‍ය මණ්ඩල සංදේශ අංක - 17/0012/724/001 හා 2016.12.24 දිනැති, තීරණය - 2017.01.10
අමාත්‍ය මණ්ඩල සටහන අංක - 17/0327/724/001 - 1 හා 2017.02.09 දිනැති , තීරණය - 2017.02.21
අමාත්‍ය මණ්ඩල සංදේශ අංක - 17/1916/728/016 - 1 හා 2017.08.23 දිනැති , තීරණය - 2017.09.12
අමාත්‍ය මණ්ඩල සංදේශ අංක - 17/2253/724/030 - 11 හා 2017.10.05 දිනැති, තීරණය - 2017.10.10
අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය - 18/0101/724/003 හා 2018.01.03 දිනැති, තීරණය - 2018.01.30
අමාත්‍ය මණ්ඩල සටහන අංකය - 18/0333/724/003-I හා 2018.02.19 දිනැති, තීරණය - 2018.02.27
අමාත්‍ය මණ්ඩල සටහන අංකය - 18/0333/724/003-II හා 2018.03.07 දිනැති තීරණය - 2018.03.20
අමාත්‍ය මණ්ඩල සටහන අංකය - 18/0779/724/003-III හා 2018.04.12 දිනැති හා තීරණය - 2018.05.09
අමාත්‍ය මණ්ඩල සටහන අංකය - 18/0891/724/003-IV හා 2018.05.02 දිනැති හා තීරණය - 2018.05.15

---

**1. පසුබිම :**

අපද්‍රව්‍ය වලින් විදුලිය නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් තුම්බෝවිල කරදියාන ප්‍රදේශයෙහි ස්ථාපිත කිරීම සඳහා සී/ස ෆෙයාවේ හෝල්ඩින් (පුද්.) සමාගම (M/S Fairway Holdings (Pvt.) Ltd.) වෙත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, අපද්‍රව්‍ය බලශක්තියක් බවට පත් කිරීමේ තාක්ෂණය (Waste to Energy Technology) **(ඇමුණුම 1)** පදනම් කොටගෙන කසල පිරියැකසුම් හා පිරිපහදු කිරීමට රු. 36.20/Kwh සැකසූ අයක්‍රමයක් සඳහා සී/ස ෆෙයාවේ හෝල්ඩින් පුද්.) සමාගම (M/S Fairway Holdings (Pvt.) Ltd.) හා සී/ස වෙස්ටර්න් පවර් (පුද්.) සමාගම (M/S Western Power (Pvt.) Ltd.) විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලද අතර. සී/ස වෙස්ටර්න් පවර් (පුද්.) සමාගම (M/S Western Power (Pvt.) Ltd.) දැනටමත්, රු. 36.20/Kwh සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් තබා ඇති අතර, මහා භාණ්ඩාගාරයෙන් සී/ස වෙස්ටර්න් පවර් (පුද්.) සමාගම (M/S Western Power (Pvt.) Ltd.) වෙත ලැබෙන සහනාධාරය රු. 13.10/Kwh වේ.

විශේෂිත ව්‍යාපෘතියක් සඳහා විශේෂ කාර්යය ආයතනයක් (Special Purpose Vehicle) (නාගරික සංවර්ධන අධිකාරිය සිය ප්‍රදාන ලිපියේ (LOA) සඳහන්කොට ඇති එක් කොන්දේසියකි) ස්ථාපිත කරන මෙන් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (MMWD) විසින් සී/ස ෆෙයාවේ හෝල්ඩින් පුද්ගලික සමාගම (M/S Fairway Holdings (Pvt.) Ltd.) වෙතින් ඉල්ලීමක්කොට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සී/ස ෆෙයාවේ හෝල්ඩින් පුද්ගලික සමාගම (M/S Fairway Holdings (Pvt.) Ltd.) විසින් සිය විශේෂ කාර්යය ආයතනය (Special Purpose Vehicle) වශයෙන් සී/ස ෆෙයාවේ අපද්‍රව්‍ය කළමනාකරණ (පුද්.) සමාගම (M/S Fairway Waste Management (Pvt.) Ltd.) ස්ථාපිතකොට ඇති අතර, නම වෙනස් කිරීම සහ සී/ස ෆෙයාවේ අපද්‍රව්‍ය කළමනාකරණ (පුද්.) සමාගම (M/S Fairway Waste Management (Pvt.) Ltd.) නමින් අනුමත සම්මත අයක්‍රමය රු. 36.20/Kwh බව යළිත් වතාවක් සහතික කිරීම සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (MMWD) විසින් 2018.01.03 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කොට ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් නම වෙනස් කිරීම සඳහා වන අනුමැතිය 2018.01.30 දිනැතිව ලබා දී ඇති නමුත් සී/ස ෆෙයාවේ අපද්‍රව්‍ය කළමනාකරණ (පුද්.) සමාගම (M/S Fairway Waste Management (Pvt.) Ltd.) වෙත වන සම්මත අයක්‍රමය වන රු. 36.20/Kwh සඳහා අනුමැතිය ඉල්ලීම පිළිබඳ සලකා බැලූ මහා භාණ්ඩාගාරය, සිය නිරීක්ෂණ මඟින්, ශ්‍රීලංකා රජය විසින් දැරිය යුතු වන රු. 13.10/Kwh දැරීම සඳහා තිරසර විසඳුමක් (CEB හී අනුමත අයක්‍රමය වනරු. 23.10/kWh හා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අයක්‍රමය වන රු. 36.20/Kwh වන අයක්‍රමය අතර වෙනස) සොයා බලන මෙන් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (MMWD), මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම්කොට ඇත.

මෙම ගැටළුව විසඳීම සඳහා, මුදල් හා ජන මාධ්‍ය, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති සහ මහානගර හා බස්නාහිර සංවර්ධන (MMWD)යන අමාත්‍යාංශවල ලේකම්වරුන් විසින් මේ සම්බන්ධ සූත්‍රයක් සකස්කොට ඔවුන්ගේ නිරීක්ෂණ සහිත

වාර්තාව ඉදිරිපත්කොට ඇත. කෙසේවුවත්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් නියෝජනයක් නොතිබූ බව සටහන් කරගත යුතු වේ.

***ඔවුන්ගේ වාර්තාව හා නිරීක්ෂණ අනුව:***

| | |
|---|---|
| අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත අයක්‍රමය | රු. 36.20/Kwh |
| ලංකා විදුලිබල මණ්ඩලය අනුමත කළ අයක්‍රමය | රු. 23.10/Kwh |
| ශුද්ධ සහන මිල | රු. 13.10/Kwh |

***(ඇමුණුම 02)***

අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත) විසින් මෙම අප්‍රද්‍රව්‍ය හැසිරවීමේ ගාස්තුව (tipping fee) පළාත් පාලන ආයතන වලින් එකතු කරගෙන රු. 7.75/kWh ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත හිලව් කළ යුතු අතර, ඉතිරි රු. 5.35/kWh වන මුදල මහා භාණ්ඩාගාරය විසින් ගෙවිය යුතු වේ. ඉහත නිර්දේශ මත පදනම්ව, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (MMWD) විසින් අංක 18/0779/724/003 –III හා 2018.04.12 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර, ඊට 2018.05.09 දිනැතිව අනුමැතිය ලැබී ඇත. එසේම මහා භාණ්ඩාගාරය සිය නිරීක්ෂණවල දක්වා ඇත්තේ අප්‍රද්‍රව්‍ය හැසිරවීමේ ගාස්තුව (tipping fee) පළාත් පාලන ආයතනවලින් එකතුකර ගැනීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කරගත යුතු බව සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු. 7.75/Kwh හිලව් කළ යුතු බවයි.

**2. වර්තමාන තත්වය :**

බස්නාහිර පාළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවේ දක්වා ඇති පරිදි පාළාත් පාලන ආයතන විසින් වර්තමානයේ ගෙවනු ලබන අප්‍රද්‍රව්‍ය හැසිරවීමේ සත්‍ය ගාස්තුව (tipping fee) මත පදනම්ව ඔවුන්ට දැරිය හැකි වන්නේ රු.2.00/kWh පමණක් වන අතර, ඉතිරි රු. 11.10/kWh මහා භාණ්ඩාගාරය විසින් ගෙවිය යුතුවේ. ***(ඇමුණුම 03)***

**3. යෝජනා :**

3.1 රු.2.00/kWh ක් දැරීමට බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ලබාදුන් එකගත්වය සළකා බලා, ඉල්ලුම්කරන ශුද්ධ සහන මිල වන රු.11.10/kWh මහා භාණ්ඩාගාරයෙන් ගෙවීමට නියම කිරීම.

3.2 ඉහත 3.1 හි යෝජනාට මහා භාණ්ඩාගාරය එකග නොවේ නම්, පහත සඳහන් කරුණු සලකා බලා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රායෝගික විසදුමක් ලබා දීම,

- ජාත්‍යන්තර තරඟකාරී මිළ ගණන් කැඳවීමේ ක්‍රමය අනුගමනය කරමින් මෙම ව්‍යාපෘතින් තෝරා ගැනීම.
- අවස්ථා 02 දී, මී/ස ෆෙයාවේ හෝල්ඩින් පුද්ගලික සමාගම (M/S Fairway Holdings (Pvt.) වෙත නාගරික ඝණ අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් නිර්දේශිත අයක්‍රමය (වසර 20ක කාලයක් සඳහා සමාන වූ) යටතේ ජනනය කරනු ලබන විදුලිය ඒකකයකට රු.36.20/kWhක මුදලක් ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීම.
- මී/ස වෙස්ටර්න් පවර් (පුද්.) සමාගම (M/S Western Power (Pvt.) Ltd.) සඳහා දැනටමත් ශුද්ධ සහන මිල ලෙස රු. 13.10/Kwh ක් ලබා දීමට මහා භාණ්ඩාගාරය එකග වීම.

3.3 රු.36.20/ kWh සැකසූ අයක්‍රමයක් සඳහා මී/ස ෆෙයාවේ අපද්‍රව්‍ය කළමනාකරණ පුද්. සමාගම (M/S fairway waste management (Pvt.) Ltd.) සමග සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට එළඹෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට නියම කිරීම.

**4. අනුමැතිය ඉල්ලීම :**

ඉහත තත්ත්වයන් සළකා බලා, ඉදිරිපත් කරන ලද නිරීක්ෂණය යලි සළකා බලන ලෙසත් යෝජනා අංක 3.1 හෝ 3.2 හා 3.3 සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටිමි.

**පාඨලී චම්පික රණවක (පා.ම.)**
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
17 -18 වන මහල ,
සුහුරුපාය, බත්තරමුල්ල.
2018.01.08